# 2 නිදහස සමරමු

"අද පෙබරවාරි හතර වැනි දා. අද අපේ ජාතික නිදහස් දවස." කමලා කිව්වා.

"අද අපට නිවාඩු. අද අපි මොනව ද කරන්නේ?" රාජු ඇහුවා.

"අද නිදහස් උත්සවය ගැන පුතාලාට ගුවන්විදුලියෙන් අහන්න පුළුවන්. රූපවාහිනියෙන් බලන්න පුළුවන්." අම්මා කීවා.

රාජු ගුවන්විදුලිය ක්‍රියාත්මක කළා.

"ලංකා ලංකා - පෙම්බර ලංකා

පිනවමු ඔබ ලංකා


හොබවමු ඔබ ලංකා දිවි දී

සුරකිමු ඔබ ලංකා"



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

දේශාභිමානී ගීතයක් ගුවන්විදුලියෙන් විකාශය වුණා. ගීතය අවසානයේ නිවේදනයට රාජුත් කමලාත් සවන් දුන්නා.



"අද පෙබරවාරි මාසෙ හතර වැනි දා. ශ්‍රී ලාංකිකයන්ගේ නිදහස් දිනය අදයි. ඉංග්‍රීසීන්ගෙන් ශ්‍රී ලංකාවට නිදහස ලැබුණේ අද වගේ දවසක. ඊට ඉස්සර ශ්‍රී ලංකාව ඉංග්‍රීසි ජාතිකයන්ට යටත්වෙලයි තිබුණෙ. නිදහස දිනා ගන්න ලංකාවේ මිනිස්සු බොහෝ ම මහන්සි වුණා. අවසානයේ අපට නිදහස ලැබුණා. අපි නිදහස් ජාතියක් වුණා. ඊට පස්සේ අපට ම කියලා ජාතික කොඩියක්, ජාතික ගීයක් හදා ගත්තා."

නිවේදකයා දිගටම විස්තර කළා.

"අයියේ, ජාතික ගීය ලිව්වේ කවු ද?" කමලා ඇහුවා.

"ආනන්ද සමරකෝන් මාමා."

"ජාතික ගීය හරිම ලස්සනයි නේ ද, අයියේ?"

"ඔව්, ඒ අදහස් හරිම උදාරයි. ඊට අපි ගරු කරන්න ඕනෑ.

ජාතික ගීය ගායනා කරන විට අපි අසුන්වලින් නැගිටින්න ඕනෑ."රාජු කිව්වා.

## ක්‍රියාකාරකම 1

මෙම පාඩම ශබ්ද නගා කියවන්න. කියවීමට සවන් දී පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න.

(i) ලංකාවට නිදහස ලැබුණේ කවදා ද?

(ii) නිදහස ලැබීමට පෙර ශ්‍රී ලංකාව යටත් වෙලා තිබුණේ කාහට ද?


(iii) ජාතික ගීය ලිව්වේ කවුද?

(iv) ගුවන්විදුලිය හඳුන්වන තවත් වචනයක් කියන්න.

(v) ජාතික ගීය ගායනා කරන විට අසුන්වලින් නැගිටින්නේ ඇයි?

## ක්‍රියාකාරකම 2

ගුවන්විදුලි නිවේදනයකට පන්තියේ සියලු දෙනා සවන් දෙන්න. පන්තිය කණ්ඩායම් දෙකකට බෙදී, නිවේදනයෙන් කියවුණු දේ ගැන කතා කරන්න. එක් කණ්ඩායමක් ප්‍රශ්න අසන්න. අනෙක් කණ්ඩායම උත්තර දෙන්න.



## ක්‍රියාකාරකම 3

**අ.** පහත සඳහන් දැන්වීම හඬ නගා කියවන්න.

### දැන්වීමයි.

සමගිපුර විදුහලේ
නිවාසාන්තර මලල ක්‍රීඩා උත්සවය

2008.03.06 වැනි බ්‍රහස්පතින්දා
ප.ව.1.30 ට

විදුහල් ක්‍රීඩාපිටියේ දී පැවැත්වේ.

**ඔබ සැමට ආරාධනා!**



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

**ආ.** දැන්වීමට සවන් දී පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු කියන්න.

(i) නිවාසාන්තර ක්‍රීඩා උත්සවය පැවැත්වෙන පාසලේ නම කුමක් ද?

(ii) එය පැවැත්වෙන දිනය කවදා ද?


(iii) එය පැවැත්වෙන දවස කවදා ද?

(iv) එය පැවැත්වෙන්නේ කීයට ද?

(v) පාසලේ කවර ස්ථානයක ක්‍රීඩා උත්සවය පැවැත්වේ ද?

## ක්‍රියාකාරකම 4

**අ.** පහත දැක්වෙන්නේ තාප්පයක අලවා තිබුණු පෝස්ටරයකි. එය හඬ නගා කියවන්න.




**ආ.** මේ ප්‍රශ්නවලට උත්තර දෙන්න.

(i) මේ පෝස්ටරයෙන් කියවෙන ප්‍රධාන කරුණ කුමක් ද?

(ii) එය පැවැත්වෙන දිනය කවදා ද?

(iii) එය පැවැත්වෙන දවස කවදා ද?



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

(iv) එය පැවැත්වෙන ස්ථානය කුමක් ද?

(v) එය ඉදිරිපත් කරන්නේ කවුරු ද?

## ක්‍රියාකාරකම 5

පහත සඳහන් අත්පත්‍රිකාව ශබ්ද නගා කියවන්න.

### නිවේදන කටයුතු සඳහා උපදෙස්

- නිවේදනයක් කිරීමේ දී වචන පැහැදිලි ව හඬ නගා කියවිය යුතු ය.
- පණිවිඩය ඉතා නිරවුල් හා පැහැදිලි විය යුතු ය.
- සවන් දෙන්නා ගැන සැලකිලිමත් වෙමින් නිවේදනය කළ යුතු ය.
- නිවේදනය සඳහා උචිත වචන යොදා ගත යුතු ය.

## ක්‍රියාකාරකම 6

පාඩමේ ඇති පහත සඳහන් වචන කියවන්න.

**දේශාභිමානී**

'භ' අක්ෂරය සහිත වෙනත් වචන ද කියවන්න.

| | |
|---|---|
| භය | භාග |
| භාෂාව | භීතිය |
| භූත | ලෝභ |



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## ක්‍රියාකාරකම 7

පාඩමේ ඇති පහත සඳහන් වාක්‍යවල ඉරි ඇඳි පද කෙරෙහි අවධානය යොමු කරන්න.

- රාජු <u>කිව්වා</u>.
- දෙදෙනාම අම්මාගෙන් ඇ<u>හුවා</u>.
- රාජු ගුවන්විදුලිය ක්‍රියාත්මක <u>කළා</u>.
- රාජුත් කමලාත් සවන් <u>දුන්නා</u>.

පහත සඳහන් වාක්‍ය දෙවර්ගයෙහි වෙනස වටහා ගෙන කියවන්න.

| | | |
|---|---|---|
| ✱රාජු කියනවා. | ➡ | රාජු කිව්වා. |
| ✱දෙදෙනාම අම්මාගෙන් අහනවා. | ➡ | දෙදෙනා ම අම්මාගෙන් ඇහුවා. |
| ✱රාජු ගුවන්විදුලිය ක්‍රියාත්මක කරනවා. | ➡ | රාජු ගුවන්විදුලිය ක්‍රියාත්මක කළා. |
| ✱රාජුත් කමලාත් සවන් දෙනවා. | ➡ | රාජුත් කමලාත් සවන් දුන්නා. |



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## ක්‍රියාකාරකම 8

උදාහරණයට අනුව පහත සඳහන් වාක්‍යවල හිස්තැන් පුරවා හඬ නගා කියවන්න.

**උදාහරණය:**

**අම්මා කෑම උයනවා. ඊයේ අම්මා කෑම ඉව්වා.**

(i) තාත්තා ගෙදර එනවා. ඊයේ තාත්තා ගෙදර. . .

(ii) මම පාසල් . . . . . . . ඊයේ මම පාසල් ගියා

(iii) මම බත් කනවා. ඊයේ මම බත් . . . .

(iv) අපි සෙල්ලම් . . . . ගිය සතියේ අපි සෙල්ලම් කළා.

## ක්‍රියාකාරකම 9

තද කළු පැහැයෙන් දී ඇති අකුරු කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින්, පහත සඳහන් වැකි නිවැරදිව හඬ නගා කියවන්න.

(i) **ඩොංකුටු ඩොංකුටු ඩොංකුටු** දළදා පෙරහැර එනවා.

(ii) **හා හා හරි හාවා** කැලේ මැදින් ආවා.

(iii) ඇතෙක් බරට තැගි ගෙනාවා.

(iv) ඇත මෑත නැටුම් ගැයුම් බලන්න හරි ලස්සනයි.

(v) ගම්පලින් ගෙනා ගොනා කැල ගහේ බැන්දා.

## ක්‍රියාකාරකම 10

(අ) 'ක' අකුරට පිල්ලම් යෙදෙන හැටි පහත වගුව දෙස බලා හඳුනා ගන්න. ඒ වචන ශබ්ද නගා කියවන්න.

(ආ) 'න' අකුරට පිල්ලම් එකතු වීමෙන් සෑදෙන වචන පහත දී ඇති වගුවේ හිස් කොටුවල ලියන්න.

| අකුර | වචනය | අකුර | වචනය |
|---|---|---|---|
| ක | **ක**තුර | න | නළල |
| කා | **කා**සිය | නා | |
| කැ | **කැ**වුම | නැ | |
| කෑ | **කෑ**රලා | නෑ | |
| කි | **කි**රි | නි | |
| කී | **කී**ටයා | නී | |
| කු | **කු**කුළා | නු | නුවණ |
| කූ | **කූ**ඩය | නූ | |
| කෙ | **කෙ**විට | නෙ | |
| කේ | **කේ**තලය | නේ | නේපාලය |
| කො | **කො**ස්ස | නො | |
| කෝ | **කෝ**ටුව | නෝ | |